2023.06.23

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**අභියාචනා සහ විරෝධතා ඇතුළත් කිරීම**

යම්කිසි තැනැත්තෙක් විසින් අභියාචනාවක් හෝ විරෝධතාවයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කළ හොත් එම තැනැත්තා අභිමුඛයේදීම එම අභියාචනය හෝ විරෝධතාවය ඔබේ නිලධාරීන් විසින් පරිගණක පද්ධතියට ඇතුළත් කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුයි.

- ✓ අභියාචනයක් පද්ධතියට ඇතුළත් කිරීම සඳහා ඔබේ අදාළ නිලධාරියා විසින් අභියාචනාකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ ගෘහ අංකය ලබාගත යුතුයි.
- ✓ අනතුරුව අභියාචනාකරු විසින් දත්ත පද්ධතියේ ඇති තම දත්ත සහ නිවැරදි දත්ත අතර වෙනසක් ඇත්නම් නිශ්චිතව සඳහන් කළ යුතුයි. ඒ අනුව නිලධාරියා විසින් දත්ත ඇතුළත් කළ යුතුයි. තව ද අභියාචනාකරුගේ නිවැරදි දුරකථන අංකය ඇතුළත් කිරීමට වග බලා ගන්න.
- ✓ විරෝධතාවයක් දත්ත පද්ධතියට ඇතුළත් කිරීමේ දී විරෝධතාකරුගේ වලංගු ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකථන අංකය අවශ්‍ය වේ. දත්ත පද්ධතියේ ඇති ප්‍රධාන තොරතුරු වර්ග පදනම් කරගෙන විරෝධතා ඇතුළත් කළ හැකියි.

අභියාචනා හා විරෝධතා පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමේ දී මෘදුකාංගය භාවිත කරන ආකාරය පිළිබඳ උපදෙස් මාලාව විද්‍යුත් පණිවිඩයක් ලෙස ඔබ වෙත එවනු ලැබේ.

පුද්ගලයින් විසින් ඔබේ කාර්යාලයට පැමිණ අභියාචනා හෝ විරෝධතා ඉදිරිපත් කිරීමේ දී මෙම උපදෙස් අනුව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන ලෙස ඔබේ කාර්යාලයේ සුබසාධක ප්‍රතිලාභ ඒකකයේ නිලධාරීන්ට උපදෙස් දෙන මෙන් කාරුණිකව දන්වමි.

සභාපති /කොමසාරිස්
සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය